# විශේෂ දැන්වීමයි

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## **R-22** ශීතකාරකයෙන් ක්‍රියාකරන ශීතකරණ/වායුසමන යන්ත්‍ර ආනයනකරුවන්, මිළදී ගනු ලබන්නන්, උපකරණ හිමිකරුවන් හා සේවා සපයනු ලබන ආයතන වෙත කෙරෙන විශේෂ නිවේදනයයි



හිරුගේ අහිතකර කිරණ පෘථිවියට ළගා වීම වළක්වන ඕසෝන් ස්ථරය ආරක්ෂා කර ගැනීමේ අරමුණ ඇතිව ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන්ට අනුව එහි පාර්ශවකරුවෙකු වශයෙන් ශ්‍රී ලංකාව මේ වන විට **R-22 ( HCFC-22)** ශීතකාරකය ආනයනය සීමා කර ඇති අතර 2030 වසරේ සිට එම ආනයනය මුළුමණින්ම තහනම් කිරීමට සැලසුම් කර ඇත. මෙම ශීතකාරකය වායුගෝලයට එකතු වීමෙන් ඕසෝන් ස්ථරය ක්ෂය වීම මෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහල යෑම සිදුවේ.

මෙම ආනයන සීමාවන් නිසා වර්තමානයේ හා විශේෂයෙන්ම අනාගතයේදි වෙළද පොළෙහි **R-22 ( HCFC-22)** ශීතකාරකයේ හිගයක් සහ එහි ප්‍රතිඵලයක් ලෙස මිළ ඉහල යෑමක් අපේක්ෂා කල හැක. මෙම හේතුව නිසා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දැනටමත් සවිකර ඇති **R-22 ( HCFC-22)** ශීතකාරකයෙන් ක්‍රියා කරන ශීතකරණ හා වායුසමන යන්ත්‍ර/පද්ධති නඩත්තු කටයුතු කිරීම දුෂ්කර කටයුත්තක් වනු ඇත. මේ වන විට **R-22 ( HCFC-22)** ශීතකාරකයෙන් ක්‍රියාකරන අළුත් ශීතකරණ හා වායුසමන යන්ත්‍ර/පද්ධති ආනයනය තහනම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඊට අවශ්‍ය නෛතික විධිවිධානයන් සම්පාදනය කෙරෙමින් පවති.

ඉහත කරුණු සලකා බලා අනාගතයේදි ඇති විය හැකි අපහසුතාවයන්ගෙන් වැලකීම පිණිස ශීතකරණ සහ වායුසමන යන්ත්‍ර මිළදී ගැනීමේදි **R-22 ( HCFC-22)** ශීතකාරකයෙන් ක්‍රියාකරන වායුසමන යන්ත්‍ර මිළදී ගැනීමෙන් හැකිතාක් දුරට වැලකී ඒ සඳහා ඇති විකල්ප ශීතකාරක වන R-410A , R-32 හා R-290 වලින් ක්‍රියාකරන වායුසමන යන්ත්‍ර මිළදී ගැනීමට කටයුතු කරන ලෙස මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි. ආනයනය පාලනය කර ඇති **R-22 ( HCFC-22)** ශීතකාරකයෙන් ක්‍රියාකරන වායුසමන යන්ත්‍ර ආනයනය හා මිළදී ගැනීමෙන් ආනයනයකරුවන්ට හා පාරිභෝගිකයන්ට සිදුවිය හැකි මූල්‍යමය හානිය මෙන්ම පරිසරයට වන හානිය අවම කිරීමේ අරමුණින් මෙම නිවේදනය නිකුත් කරනු ලබන බව කාරුණිකව සළකනු මැනවි. මේ පිළිබඳව සියළු තොරතුරු 011 2034215, 011 2034221හෝ 011 2034222 දුරකතන අංක මගින් සහ www.mmde.gov.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි බව මහජනතාව වෙත වැඩිදුරටත් දැනුම් ලැබේ.

ලේකම්,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
සොබාදම් පියස, අංක 416/C/1, රොබට් ගුණවර්ධන මාවත,බත්තරමුල්ල